**සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව - 2019**
**-----------------------------------------------------------------**

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ (“සමාගම”) 2016 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
**-----------------------------------------------------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 අප්‍රේල් 01 දින සිට 2019 මාර්තු 31 දින දක්වා වූ වර්ෂ 3කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා, මෙම වාර්තාවේ දිනය වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
**------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

## 2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 ජූලි 01 දිනැති අංක පීර්/ජීඕසීඔ/ටීආර්9 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ ලිපිය අනුව සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට නිසි බලධාරියකු එම ලිපියේ දින සිට වසරක කාල සීමාවක් සඳහා පත්කර තිබියදී අදාළ පත්වීම දීර්ඝ කර නොගෙන 2019 වර්ෂය දක්වා නිසි බලධාරියා ලෙස කටයුතු කර තිබුණි. | නිසි බලධාරී ලෙස කටයුතු කරමින් සිටි ඩබ්.එස්.ගමගේ මහතාගේ පත්වීම 2011.07.01 දින සිට මේ දක්වා බල පැවැත්වෙන පරිදි නියමානුකූල කිරීමටත්, ඉදිරියට මාස 06 ක කාලයකට ඔහුගේ පත්වීම දීර්ඝ කිරීමටත් මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිසි බලධාරීගේ වසරක ධූර කාලය ඉකුත් වී ඇති බැවින් වහාම එම තනතුරු දැරීම නීත්‍යානුකූල කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව සීමාසහිත ලංකා නිෂ්පාදන අපනයන සංස්ථාවේ ආයෝජනය කර තිබූ රුපියල් මිලියන 52 ක ආයෝජනවල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | මෙම ආයෝජන ශේෂය 2002 වසරේ සිට පැවතෙන ශේෂයක් වන අතර, එය Lanka Products Export Corporation සමූහය විසින් කරන ලද ආයෝජනයකි. මෙතෙක් මේ පිළිබඳ තොරතුරු සොයාගැනීමට නොහැකි වී ඇති අතර, එම ශේෂය පිළිබඳව තොරතුරු සොයා ඉදිරිපත්කරන ලෙස නිසි බලධාරී වෙත දන්වා ඇත. | ආයෝජනයට අදාළ තොරතුරු යාවත්කාලීව පවත්වාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු එකතුව රු.764,957,506 ක් හා එකතුව රු. 56,133,035 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් 2019 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂ පිළිබඳ උපලේඛන, කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ශේෂයන් 2005 වසරේ සිට පැවතෙන අතර, එවකට විගණනය කළ තිස්ස ප්‍රනාන්දු සමාගම විසින් මෙම කාලච්ඡේදයට අදාළ මෙවැනි වාර්තා ලබාදී නොමැති නමුත්, මෙම තොරතුරු සොයා ඉදිරිපත් කරන ලෙස නිසි බලධාරී වෙත දන්වා ඇත. | ලැබිය යුතු ශේෂ පිළිබඳ වාර්තා නිසි පරිදි පවත්වා ගත යුතුය. |
| (ඈ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව පිරිවැය රු.17,357,133 ක් වූ වාහන හා රු.23,530,433 ක් වූ යන්ත්‍ර තක්සේරු කර ආයෝජකයෙකුට විකුණා ඇතත්, තක්සේරු වාර්තා හා මුදල් ලද බවට තහවුරු වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ආයෝජකයාට විකිණීමට අදාළ සියළු කටයුතු සිදු කරන ලද්දේ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් බැවින් එම ආයතනය විමසා ඔබ වෙත දන්වමි. | ස්ථාවර වත්කම් අපහරණයට අදාළ වාර්තා සුරක්ෂිතව තබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.1,283,471 ක මුදල් ශේෂය හා රු.3,037,306 ක ස්ථාවර තැන්පතු මුදල් ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විමසා ඔබ වෙත දන්වමි. | 2011 මාර්තු 31 දිනට වූ අදාළ වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. |
| (ඊ) | ඉඩම් ඇපයට තබා මූල්‍ය ආයතනවලින් ලබාගෙන තිබූ රු. 901,610,000 ක දිගුකාලීන ණය, රු. 17,185,562 ක් වූ බැංකු අයිරා හා එම ශේෂයන්හි වර්තමාන තත්ත්වයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ආයෝජකයන්ගෙන් ලද අත්තිකාරම් මගින් බොරැල්ල මහජන බැංකු ශාඛාවේ තිබූ මෙම ණය ශේෂය පියවීමට කටයුතු කර ඇති අතර, එම තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලෙස නිසි බලධාරී වෙත දන්වා ඇත. | 2011 මාර්තු 31 දිනට පැවති වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. |
| (උ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය රු.10,768,203 ක්ද ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත හඳුනා නොගත් රු. 17,874,912 ක්ද තහවුරු කර ගැනීමට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොවුනි. | අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කරන ලෙසට නිසි බලධාරී වෙත උපදෙස් ලබාදී ඇත. | 2011 මාර්තු 31 දිනට පැවති වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. |
| (ඌ) | ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ සිදු වූ රු.මිලියන 500 කට ආසන්න රාජ්‍ය මුදල් අවභාවිතයක් පිළිබඳව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ ගොනු කර ඇති නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් විමසීමට කටයුතු සිදු කර ඔබ වෙත දන්වමි. | මුදල් අවභාවිතාවයට අදාළව ගෙන ඇති පියවර සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරන ගැසට් පත්‍රයෙන් සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර තිබියදී සංස්ථාව සතු කර්මාන්තශාලා 06 න් කර්මාන්තශාලා 03 ක් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මඟින් හා එකක් රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව මගින් පෞද්ගලික අංශය වෙත බදු පදනම මත ලබා දී තිබුණු අතර, සිල්වඩෙල් කර්මාන්තශාලාව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරූ බව සඳහන් වුවද ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම ඇල්පිටිය කර්මාන්ත ශාලාව වසර 10 ක පමණ සිට නිශ්කාර්යව පැවතුණි.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2012 වර්ෂයේ සිට 2016 දක්වා මාවනැල්ල කේන්ද්‍ර අපසාරි, මාවනැල්ල ටයර් ටියුබ්, සහ බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා 03 න් අය වන බදු කුලිය බදු ගිවිසුම් පරිදි රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් අයකර ගතයුතු වුවත් එසේ අයකර ගෙන තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.** | **මෙම මුදල් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව එක්රැස් කරන බැවින් එම තොරතුරු රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව සතුව ඇත. එම සංස්ථාව විමසා තොරතුරු ඉදිරිපත් කරමි.** | **රාජ්‍ය දේපල බදු පදනමට දීමෙන් පසු එම බදුකුලී ආදායම් නිසි පරිදි අයවන්නේද යන්න සම්බන්දයෙන් තොරතුරු නිසි පරිදි පවත්වා ගත යුතු වීම හා ඊට අදාළ තොරතුරු විගණනයට ලබා දීමට කටයුතු කල යුතුය.** |
| (ආ) | **ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අයත් මාවනැල්ල පිහිටි කේන්ද්‍රාපසාරි/ කුට්ටි රබර් කර්මාන්තශාලාවේ ප්‍රධාන ගොඩනැඟිල්ලේ වහලයේ කොටසක් 2018 ජූලි 07 දින කඩා වැටී ඇති අතර, නැවත 2019 මැයි 24 දින ද වහලයේ කොටසක් කඩා වැටී ඇති බව වාර්තා කර තිබුණි. ඒ අනුව 2019 ජූලි 11 දින දක්වාම එය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබූ අතර, එය හේතු කරගෙන 2018 ජූලි 13 සිට 2019 මාර්තු 31 දක්වා වූ කාලය සඳහා රු.5,938,623 ක් වූ බදු කුලිය මහා භාණ්ඩාගාරයට ගෙවා නොතිබුණි.** | **සංස්ථාව බදු දුන් කර්මාන්තශාලාවලින් ලැබෙන බදු මුදල් මේ වන විට රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශයට ලැබෙන අතර, සංස්ථාවේ මාසික නඩත්තුව සඳහා එයින් රු. 100,000/- ක මුදලක් පමණක් මාසිකව සංස්ථාව වෙත ලබාදේ. සංස්ථාව සතුව බදු දී ඇති මාවනැල්ල කේන්ද්‍රාපසාරි/කුට්ටි රබර් කර්මාන්තශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ කඩා වැටී ඇති වහලය පිළිසකර කරදීම සංස්ථාවට අයත් බදුදී ඇති කර්මාන්තශාලාවන්ට අදාළ බදු මුදල් අය කරනු ලබන රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කිරීමට එකඟතාවය පළ කර ඇත.** | **බදු ගිවිසුම ප්‍රකාරව කර්මාන්තශාලාව හානිවීම ප්‍රතිපූර්ණය කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු අතර, ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අය කර ගැනීමට කටයුතු කල යුතුය.** |
| (ඇ) | **2010 ජුනි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර සමාලෝචන කමිටුවේ අධීක්ෂණය යටතේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ තාක්ෂණික මඟ පෙන්වීම මත කර්මාන්තශාලා බදුදීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජකයන් වෙතින් අභිප්‍රාය ප්‍රකාශන කැඳවා සුදුසු ආයෝජකයෙක් තෝරා** | **රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ MSRED/6/1/4 අංක දරන 2011.01.27 දිනැති ලිපිය මගින් ලබාදී ඇති අනුමැතිය මත වහරක කර්මාන්තශාලාව පෞද්ගලික අංශය වෙත බදුදී ඇත.** | **අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කල යුතුය.** |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට අනුමැතිය දී තිබියදී සුදුසු ආයෝජකයෙක් තෝරා ගැනීමට පෙර 2011 පෙබරවාරි 14 දින වන විටත් අක්කර 06 යි පර්චස් 07 ක ඉඩම හා ගොඩනැගිලි සහිත වහරක ක්‍රේප් රබර් කර්මාන්තශාලාව රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව විසින් පෞද්ගලික පාර්ශවයක් වෙත බදු දී තිබුණි. | | |
| (ඇ) | වහරක කර්මාන්තශාලාවේ බදු කුලිය දැනට ක්‍රියාත්මක නොවන සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ ජංගම ගිණුමකට අයවෙන අතර, එම බදු කුලිය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව බදු ගැනුම්කරු සමග බදු ගිවිසුම්වලට එළඹී ඇති අතර, මේ වන විට හිඟ බදු ගෙවීම සඳහා බදුකරු එකඟතාව පළ කර ඇත. | එම බදු කුලිය රජයේ ආදායමට බැර වන ලෙස කටයුතු කල යුතුය. |
| (ඉ) | වසර 10 කට අධික කාලයක සිට වසා දමා තිබෙන සංස්ථාවට අයත් ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව ඉදිකර තිබෙන අක්කර 06 යි රූඩ් 03 යි පර්චස් 24.3 ක ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බැවින් එම සභාව විසින් එම ඉඩම හා ගොඩනැගිලි වාණිජ කටයුත්තක් සඳහා බදු දීමටත් කර්මාන්ත ශාලාවේ සවිකළ යන්ත්‍ර සූත්‍ර ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කර විකිණීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදුකළ යුතු බවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 අප්‍රේල් 09 දින ලබාගෙන ඇතත්, විගණන වාර්තාවේ දින වන විටත් එම කටයුතු සිදුකර නොතිබුණි. | 2019.05.02 දිනැතිව ප්‍රධාන තක්සේරුකරුගෙන් ඊට අදාළ වන තක්සේරු වාර්තා 03 ක් ඉල්ලුම් කළ අතර, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මුහුණපාන ලද තාක්ෂණික දුෂ්කරතාවයක් හේතුවෙන් එම වාර්තා සැකසීම ප්‍රමාද විය. ඒ සඳහා පිළියමක් ලෙස රබර් පර්යේෂණායතනයේද, බාහිර පාර්ශවයක ඉංජිනේරු මහතෙකුගේද සහය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට මේ වන විට කටයුතු කර ඇත. ඒ අනුව, අදාළ තක්සේරු වාර්තා ලැබුණු විගස අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කල යුතුය. |